# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1920/29 – 2015 ජුනි 25 වැනි බ්‍රහස්පතින්දා – 2015.06.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය මුනසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පිටිගල් කෝරළය සුළු කොට්ඨාසයේ, 1524, කඳානේගෙදර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කඳානේගෙදර ගමේ පිහිටි කුරුණෑගල දිස්ත්‍රික් සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Ku/PNN/2014/070 හා 2014.04.30 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' සහ 'බී' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 1.1871 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස්.

01. **කැබලි අක්ෂර 'ඒ' – කෝන්ගහමුලහේන නොහොත් කහටගහමුලහේන – ප්‍රමාණය: හෙක්. 1.1442 ක් පමණ**

උතුරට: ඩී. එම්. ජයතිලක හිමිකම් කියන දවටගහමුලවත්ත, කේ. ආර්. එම්. දයාසේන හිමිකම් කියන කහටගහමුලවත්ත සහ එස්. ඒ. රත්නසේන හිමිකම් කියන කහටගහවත්ත; නැගෙනහිරට: කේ. ආර්. එම්. දයාසේන හිමිකම් කියන කහටගහමුලවත්ත, එස්. ඒ. රත්නසේන හිමිකම් කියන කහටගහවත්ත, කඳානේගෙදර ධර්මපාල ද්විතීයික විද්‍යාලය පිහිටා ඇති කොස්ගහවත්ත නොහොත් කෝන්ගහමුලහේන සහ එච්. එම්. පබාකර කෞශල්‍ය හේරත් හිමිකම් කියන කැටකෑලගහහේනවත්ත නොහොත් කෝන්ගහහේනවත්ත; දකුණට: එච්. එම්. පබාකර කෞශල්‍ය හේරත් හිමිකම් කියන කැටකෑගලහහේනවත්ත නොහොත් කෝන්ගහහේනවත්ත, කැබලි අක්ෂර බී, ඩබ්. ඒ. සිසිර කුමාර විජේසිංහ සහ ඩබ්. ඒ. සරත් කුමාර විජේසිංහ හිමිකම් කියන කහටගහමුලහේන නොහොත් කෝන්ගහමුලහේන; බටහිරට: ඩබ්. ඒ. සිසිර කුමාර විජේසිංහ සහ ඩබ්. ඒ. සරත් කුමාර විජේසිංහ හිමිකම් කියන කහටගහමුලහේන නොහොත් කෝන්ගහමුලහේන සහ ඩී. එම්. ජයතිලක හිමිකම් කියන දවටගහමුලවත්ත.

02. **කැබලි අක්ෂර 'බී' – ප්‍රමාණය: හෙක්. 0.0429 ක් පමණ**

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

යොමු අංක : 4/3/8/2013/PC/555
2015 අප්‍රේල් මස 09 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 – 519



මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.